# ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය (CAASL)

## කාර්ය මණ්ඩල ඇබෑර්තු

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් උපායමාර්ගික සැලසුම් කිරීම, වෘත්තිය මාර්ගෝපදේශ හා දැඩි සුපරීක්ෂකතාවය තුළින් මනා ලෙස ස්ථාපිත වූ නියාමන කාර්ය රාමුවක් යටතේ, ජාත්‍යන්තර ප්‍රමිතීන් හා නිර්දේශිත පරිචයන් (SARPs) සහ ජාතික ව්‍යවස්ථාදායක අවශ්‍යතාවලට අනුකූල වූ ආරක්ෂිත හා සුරක්ෂිත, කාර්යක්ෂම විධිමත් හා පරිසර මිත්‍රශීලී ජාතික සිවිල් ගුවන් සේවා පද්ධතියක් මෙහෙයවීම සහතික කරනු ලබයි. ඒ අනුව ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් පහත සඳහන් තනතුර පිරවීම සඳහා ඉහළ සුදුසුකම් හා සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රයෙහි පෘථුල පළපුරුද්දක් සහිත කාර්යශූර අභිලාෂී හා ස්වයං උද්යෝගී අයවලුන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

### අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ)
### තනතුරු කේතය : HM-1-1D12 තනතුරු ගණන - 01

**වැටුප් ගෙවීම :**

- බඳවා ගැනීමේදී ගෙවනු ලබන මූලික වැටුප – රුපියල් 80,295/= (වැටුප් පරිමාණය : රුපියල් 80,295-15x2,270-114,345/= MS චක්‍රලේඛ අංක 02/2016 (1) ප්‍රකාරව වේ.)
- **වෙනත් දීමනා** : ජීවන වියදම් දීමනාව රුපියල් 7,800/= + ඉන්ධන දීමනාව 120L+ ප්‍රවාහන දීමනාව – රුපියල් 50,000/= (තමන්ගේම වාහනයක් භාවිතා කරන්නේ නම්) + වෘත්තීය දීමනාව – MS චක්‍රලේඛ අංක 05/2017 ප්‍රකාරව වේ.
- **වෙනත් ප්‍රතිලාභ** : සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය, හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමය, මරණ ප්‍රදාන යෝජනා ක්‍රමය, ප්‍රසාද දීමනා, ලබානොගත් නිවාඩු සඳහා මුදල් ගෙවීම, ජංගම දුරකථන බිල් ප්‍රතිපූරණය කිරීම.

**සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්,

සහ

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (මාස්ටර්ස්) සුදුසුකම්;

සහ

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ ප්‍රසිද්ධ පුද්ගලික අංශයේ ආයතනයක කළමනාකරණ තලයේ, තොරතුරු හා සන්නිවේදන ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දහතුනක (13) සේවා පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

**(පහත 1 හෝ 2)**

1. බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.
2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ කළමනාකරු (MM1-1)1 ශ්‍රේණිය වර්ගීකරණයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

- අයදුම්කරුවන්ගේ වයස අවුරුදු තිස් පහට (35) අඩු නොවිය යුතු අතර, පනස් පහට (55) නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.
- අවශ්‍ය වැඩිදුර තොරතුරු, රැකියාවේ විස්තර හා සම්මත අයදුම්පත් ආකෘති පත්‍රය CAASL නිල වෙබ් අඩවිය වන www.caa.lk වෙතින් බාගත කළ හැක.
- අයදුම්කරුවන් විසින්, තමන්ගේ තනතුරට අවශ්‍ය සුදුසුකම් සතුවීම සනාථ කිරීම සඳහා එම සුදුසුකම්වල හා පළපුරුද්දට අදාළ සහතිකවල පිටපත් එවිය යුතුය.
- අදාළ සම්මත අයදුම්පත් ආකෘතිය මගින් යොමු කරනු ලබන අයදුම්පත් පමණක් භාරගනු ලැබේ. රජයේ සංවිධානයක සේවය කරනු ලබන අයදුම්කරුවන්, තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මගින් යොමු කළ යුතුවේ.
- යථා පරිදි සම්පූර්ණ කළ අයදුම්පත්, ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ඊමේල් අංක employment@caa.lk වෙත යොමු කිරීමෙන් 2021.08.09 දිනට පෙර මෙම කාර්යාලය වෙත ලැබීමට සැලැස්විය යුතුය. ඒවා ලැබුණු බවට දන්වනු ලැබේ.
- අයදුම්පත්, සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක, නිලධාරී ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය අංක 152/1, මිනුවන්ගොඩ පාර, කටුනායක යන ලිපිනයට යොමු කළ යුතු අතර, අදාළ අයදුම්පත බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.
- සුදුසුකම් නිර්ණායක සපුරාලනු ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ/ විභාග සඳහා කැඳවනු ලැබේ.

**සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී,**
**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,**
**අංක 152/1, මිනුවන්ගොඩ පාර, කටුනායක.**
**2021.07.25**